# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (නව නිර්දේශය)

**සිංහල භාෂා සම්ප්‍රදාය හා කලාශිල්ප SINH – E 2025**

සෑම කොටසකින්ම එක් ප්‍රශ්නයක් හෝ අයත් වන සේ
ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

## 1 කොටස

01. සිංහල භාෂාවේ සම්භවය පිළිබඳව පවත්නා විවිධ මතවාද සමාලෝචනය කරන්න.

02. පැරණිතම ලිඛිත සාධක ඇසුරින්, සිංහල ප්‍රාකෘත අවධියේ භාෂා ලක්ෂණ මොනවා දැයි පැහැදිලි කරන්න.

03. සිංහල භාෂා පරිණාමයෙහි ලා මධ්‍යතන සිංහල අවධිය සුවිශේෂ වන්නේ කවර හේතු සාධක නිසා දැයි විමර්ශනය කරන්න.

නැතහොත්

නූතන සිංහල අවධියේ සිංහල භාෂාව මත පතිත වූ යුරෝපීය භාෂා බලපෑම් කෙබඳු දැයි සනිදර්ශන ව විභාග කරන්න.

## 11 කොටස

04. සිදත් සඟරා අක්ෂර මාලාව පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

05. 'නමින් පරව බෙදනු ලබනුයේ විබත් නම්' මෙම ප්‍රකාශය ඇසුරුකර ගනිමින් සිදතේ විබත් අදියර විමසුමට ලක් කරන්න.

06. 'සිදත් සඟරාවේ එන ලිංග වර්ගීකරණය ගැටලු සහගතය.' සාකච්ඡා කරන්න.

07. ආයාසී සන්ධි හා නිරායාසී සන්ධි වෙන් වශයෙන් හඳුන්වා සිදතේ ඉගැන්වෙන සන්ධි විග්‍රහය විභාග කරන්න.

නැතහොත්

කර්තෘකාරක වාක්‍යයක් කර්මකාරකයට නැංවීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු පැහැදිලි කරමින් උදාහරණ සපයන්න.

## 111 කොටස

08. 'ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික අවධිය මෙරට කලාශිල්පවල ආරම්භක අවධියයි.' මෙහි සත්‍යාසත්‍යතාව විමසන්න.

නැතහොත්

මහින්දාගමනය සහ දුමින්දාගමනය ලක්දිව කලාශිල්ප පෝෂණයෙහි ලා දායක වූ අයුරු පැහැදිලි කරන්න.

09. පොළොන්නරු අවධියේ බුද්ධ ප්‍රතිමා කලාවේ නිර්මාණ ලක්ෂණ කෙරෙහි බලපෑ සංස්කෘතික පසුබිම පරීක්ෂා කරන්න.

10. වස්තු විෂය හා භාවිත ශිල්ප ක්‍රම කෙරෙහි සාවධාන වෙමින් සීගිරි චිත්‍ර පිළිබඳ සමාලෝචනයක් කරන්න.

නැතහොත්

මහනුවර යුගයේ චිත්‍රවලින් පිළිබිඹු වන විශේෂ ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි)

*********************************